# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1869/30 – 2014 ජූලි 02 වැනි බදාදා – 2014.07.02

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/15/18/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්,

නිශාන්ත චමින්ද හෙට්ටිආරච්චි මයා., අංක 103/92, ධර්මරාජ මාවත, මහනුවර

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව, අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, සීදූව, ලියනගෙමුල්ල, අංක 42 හි, කේ. ඒ. ටී. ප්‍රනාන්දු මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ගාමිණී ලොකුගේ,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 ජුනි මස 20 වැනි දින,
කොළඹ දී ය.


1A – G 19823 – 100 (2014/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: අයිආර්/15/18/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,
නිශාන්ත චමින්ද හෙට්ටිආරච්චි මයා., අංක 103/92, ධර්මරාජ මාවත, මහනුවර

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව, අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ** වනුයේ,

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවයේ නියුතු නිශාන්ත චමින්ද හෙට්ටිආරච්චි මහතා විනය චෝදනාවන්ගෙන් නිදොස් කර නිදහස් කර තිබිය දී ඔහුගේ සේවය අත්හිටුවා තිබූ 2006.11.02 දින සිට 2007.08.07 දින දක්වා කාලයට වැටුප් නොගෙවීමෙන් ඔහුට අසාධාරණයක් සිදුවී ඇත්ද? එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2014 මැයි මස 19 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 – 488

---

මගේ අංකය: IR/07/14/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්,
ලංකා වැවිලිකරුවන්ගේ සංගමය, අංක 40/1, ශ්‍රී ධම්මාධාර මාවත, රත්මලාන (පරාක්‍රම වීරසේකර, ජී. ඒ. දිසානායක සහ අතුල කරුණාතිලක යන මහතුන් වෙනුවෙන්)

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,
හලාවත වැවිලි සමාගම, "කප්රුක සෙවන", අංක 165, පුත්තලම් පාර, හලාවත.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 06, ඩබ්. ඒ. සිල්වා මාවත, අංක 181/1, 503 හි, ටී. ඊ. සාන්තරාජන් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 ජූනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/07/14/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

ලංකා වැවිලිකරුවන්ගේ සංගමය, අංක 40/1, ශ්‍රී ධම්මාධාර මාවත, රත්මලාන (පරාක්‍රම වීරසේකර, ජී. ඒ. දිසානායක සහ අතුල කරුණාතිලක යන මහතුන් වෙනුවෙන්)

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

හලාවත වැවිලි සමාගම, "කප්රුක සෙවන", අංක 165, පුත්තලම් පාර, හලාවත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

හලාවත වැවිලි සමාගමේ වතු අධිකාරි ලෙස සේවයේ නියුතු පරාක්‍රම වීරසේකර මහතා, ජී. ඒ. දිසානායක මහතා සහ සහකාර වතු අධිකාරි ලෙස සේවයේ නියුතු අතුල කරුණාතිලක මහතා, යන අය විසින් භුක්ති විඳිමින් සිටි කෑෂ් කැරින් කමිෂන් (Cash Carrying Commission) ගෙවීම අත්හිටුවීමෙන් ඔවුනට කිසියම් අගතියක් සිදුවී ඇත් ද? එසේ අගතියක් සිදුවී ඇත්නම් ඔවුනට ලැබිය යුතු සහන මොනවාද? යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2014 මැයි මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 – 489

---

මගේ අංකය: අයිආර්/20/04/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්,

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 12/2, වීර මාවත, ශ්‍රී සුභූතිපුර, බත්තරමුල්ල (එම්. එස්. සිල්වා මයා. වෙනුවෙන්)

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවිඒෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, කටුනායක.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, අංක 570/බී/1 හි, පී. නවරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 ජුනි මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: අයිආර්/20/04/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,
අන්තර් සමාගම් සේවක සංගමය, අංක 12/2, වීර මාවත, ශ්‍රී සුභූතිපුර, බත්තරමුල්ල (එම්. එස්. සිල්වා මයා. වෙනුවෙන්)

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,
එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවිඒෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, කටුනායක.

**ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

පෞද්ගලික විවාහ මංගල්‍යයක දී සිදු වූ සිද්ධියක් මුල් කරගෙන එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවිඒෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ් හි සේවයේ නියුතු එම්. එස්. සිල්වා මහතාට එරෙහිව විනය පරීක්ෂණයක් පවත්වා දින දෙකක වැටුප් කැපීමෙන් අසාධාරණයක් සිදුවී තිබේද යන්න හා එසේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2014 මැයි මස 12 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 – 490

---

මගේ අංකය: IR/20/05/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්,
අන්තර් සමාගම් සේවක සංගමය, අංක 12/2, වීර මාවත, ශ්‍රී සුභූතිපුර, බත්තරමුල්ල

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,
රෝයල් සෙරමික් ලංකා පී. එල්. සී., අංක 10, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, දිවුලපිටිය, මාපලන්ගෙදර, කේ. එම්. සරත්චන්ද්‍ර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 ජුනි මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/20/05/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,
අන්තර් සමාගම් සේවක සංගමය, අංක 12/2, වීර මාවත, ශ්‍රී සුභූතිපුර, බත්තරමුල්ල

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,
රෝයල් සෙරමික් ලංකා පී. එල්. සී., අංක 10, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 03.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

රෝයල් සෙරමික් ලංකා පී. එල්. සී. ආයතනයේ ඇහැලියගොඩ කර්මාන්ත ශාලාවේ සේවය කරන 2007.06.01 දිනට පසුව සේවය ස්ථිර කරන ලද පහත උපලේඛනයේ නම් සඳහන් සේවකයින් තිස්හතර (34) දෙනා සඳහා එම කර්මාන්ත ශාලාවේ සේවය කරන අනෙකුත් සේවකයින්ට මෙන් ඉතිරි කරගත් වෛද්‍ය නිවාඩු වෙනුවෙන් මුදල් නොගෙවීමෙන් යම් අසාධාරණයක් සිදුවී ඇත්ද යන්න හා එලෙස අසාධාරණයක් සිදුවී ඇත්නම් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2014 මැයි මස 07 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

උපලේඛනය

01. බී. ආර්. ඩී. එන්. බටුගම්පල
02. අයි. පී. ඩබ්. යූ. කුමාර
03. ඒ. ආර්. කේ. කේ. ප්‍රේමරත්න
04. එම්. ඒ. ඒ. එම්. ජයතිලක
05. එච්. ඒ. ජේ. සී. හෙට්ටිආරච්චි
06. එම්. එස්. හර්ෂ
07. ජේ. එච්. ඒ. පද්මකුමාර
08. පී. එම්. එන්. ධර්මසිරි
09. අයි. පී. අයි. සී. පතිරණ
10. එම්. එම්. ආර්. කීර්තිරත්න
11. කේ. ආර්. කේ. නිශාන්ත
12. අයි. ප්‍රසාද් වැන්ඩසටන්
13. ඊ. පී. කේ. ගුණරත්න
14. ටී. ආර්. එස්. කේ. රණවීර
15. ඩබ්. ඒ. ටී. සී. වික්‍රමාරච්චි
16. කේ. අයි. කුමාර
17. යූ. ආර්. එන්. කේ. එස්. රණසිංහ
18. පී. ඒ. ජී. එස්. ධර්මරත්න
19. පී. ඩබ්. සී. ඒ. විජේසිරි
20. එච්. ඒ. ඩී. එම්. සම්පත්
21. පී. කේ. එන්. දසනායක
22. එච්. ටී. සී. ඒ. විජේරත්න
23. වයි. සී. එන්. ප්‍රේමරත්න
24. බී. එස්. කුමාර
25. කේ. ඩී. එම්. එම්. නිල්වලා
26. එස්. ඒ. එම්. ටී. සූරියආරච්චි
27. ඩී. පී. කේ. යූ. චන්ද්‍රසේන
28. ජේ. ඩී. ඉරේෂ
29. ජී. එම්. ඩී. ප්‍රේමලාල්
30. ඩබ්. ආර්. ඒ. පී. කුමාර
31. ජී. වී. ඩී. ජේ. බණ්ඩාර
32. එල්. ආර්. ආර්. කේ. ප්‍රේමරත්න
33. එච්. ඩී. එම්. එස්. එස්. දිසානායක
34. ඒ. ආර්. ටී. ඩී. නිශාන්ත

07 - 491